# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 535/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 26/03/2024<br>පැය 1440 |

## මාධ්‍ය නිවේදනය

**අන්තර්ජාල බැංකු සේවා මගින් බැංකු ගිණුම් අතර වංචනික ලෙස මුදල් මාරු කල සැකකාරියක් අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.**

මීගමුව නගරයේ පිහිටි පුද්ගලික බැංකු ශාඛාවක පවත්වාගෙන ගිය ගිණුම් 06 කින් අවස්ථා 16 කදී ගිණුම් හිමියන්ගේ අනුදැනුමකින් තොරව අන්තර්ජාල බැංකු සේවා මගින් මුදල් මාරු කර රුපියල් මිලියන 37 ක මුදල් වංචා කිරීමක් සම්බන්ධව එම බැංකුවේ කළමනාකරු විසින් 2024.03.01 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි.

ඒ අනුව සිදු කල විමර්ශනයේදී එම බැංකු ශාඛාවේ සහකාර කළමනාකාරිය විසින් මෙම මුදල් වංචාව සිදු කර ඇති බවට හා ඇය විසින් බැංකු ගිණුම් වලින් අන්තර්ජාල බැංකු පහසුකම් යටතේ වංචනිකව ඇයගේ සැමියාගේ නමින් වෙනත් පුද්ගලික බැංකු දෙකක පවත්වා ගෙන යනු ලබන ගිණුම් 02 ක් වෙත මුදල් මාරු කර ඇති බවට නිරීක්ෂණය වී ඇත. තවද පැමිණිල්ලේ සඳහන් අවස්ථා 16 මගින් හෙළි නොවූ මුදල් ගනුදෙනු සම්බන්ධයෙන්ද අනාවරණය වී ඇති අතර සැකකාරිය විසින් රුපියල් මිලියන 33ක් ඉක්මවන මුදලක් ඇයගේ සැමියාගේ නමින් පවත්වාගෙන යන ගිණුමකට හා රුපියල් මිලියන 13ක මුදලක් සැකකාරිය විසින් පවත්වා ගෙන යන ගිණුමකට බැර කර ඇති බවටත් නිරීක්ෂණය වී ඇති අතර සැකකාරිය විසින් මෙම ආකාරයට වංචාකර ඇති මුදල රුපියල් මිලියන 84 කට අධික බවටද තොරතුරු ලැබී ඇත.

තවද මෙම වංචනික ක්‍රියා මගින් උපයා ගන්නා ලද මුදල් රුපියල් මිලියන 10ක් පමණ වැයකර සැකකාරිය හා ඇයගේ සැමියා ඕස්ට්‍රේලියාව බලා යාමට සැලසුම් කර තිබූ බවත්, අනාවරණය වී ඇති අතර ඉහත පැමිණිල්ල ලැබීමට ප්‍රථම සැකකාරියගේ සැමියා ඕස්ට්‍රේලියාව බලා විදේශ ගතව ඇත.

ඒ අනුව විමර්ශන නිලධාරීන් විසින් කඩිනමින් ක්‍රියාත්මකව සැකකාරියට විදේශ ගමන් අත්හිටුවීමේ නියෝගයක් අධිකරණය මගින් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර 2024.03.25 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය හා වාණිජ අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් මුදල් වංචා කිරීම, සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීම,

සාපරාධී විශ්වාසය කඩ කිරීම සහ එකී මුදල් විශුද්ධිකරණය කිරීම සම්බන්ධයෙන් අදාල සැකකාරියව අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 41 ක් වන කිරිමැටියාව, ලුණුවිල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෙම සැකකාරිය පදිංචි ලුණුවිල ප්‍රදේශයේ පිහිටි නිවස විමර්ශන නිලධාරීන් විසින් පරීක්ෂාවට ලක් කිරීමේදී අන්තර්ජාල බැංකු පහසුකම් සඳහා භාවිතා කරන ලද වටිනා ජංගම දුරකතනයක් සහ ඉහත අපරාධයෙන් උපයා ගන්නා ලද මුදල් රුපියල් කෝටියක් පමණ භාවිතා කරමින් උකස් කරන ලද ඉඩමක් බේරා ගැනීමට අදාල ලිපි ලේඛණද සොයාගෙන ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය හා වාණිජ අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**